**ආධුනික උප පොලිස් පරීක්ෂක වරුන් / වරියන් " ආධුනික පොලිස් කොස්තාපල් වරුන් / වරියන් ගේ සහ ආධුනික පොලිස් කොස්තාපල් රියදුරන්ගේ සේවය ස්ථිර කිරීමේ පිහිණුම් " ප්‍රථමාධාර හා භාෂා පරීක්ෂණ.**

පොලිස්පති චක්‍රලේඛණ අංක 2021/2007 හා ආයතන චක්‍රලේඛණ අංක 25/2007 අනුව ආධුනික උ'පො'ප' / කා'උ'පො'ප සහ ආධුනික පො'කො' / කා'පො'කො' සහ ආධුනික පො.කො.රි' වරුන්ගේ සේවය ස්ථිර කිරීමේ පිහිණුම්/ ප්‍රථමාධාර සහ භාෂා (සිංහල" දෙමළ" ඉංග්‍රීසි) පරීක්ෂණ 2009 හතරවෙනි කාර්තුව සඳහා පැවැත්වීමට අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

1. **සුදුසුකම්**

ආධුනික උ'පො'ප' / කා'උ'පො'ප' - පො'කො' / කා'පො'කො' සහ පො'කො'රි' වරුන්ගේ ආධුනික කාළය 2010 මාර්තු 31 වන විට වසර 03 ක් සම්පූර්ණවන හෝ දැනටමත් වසර 03 ක් සම්පූර්ණ වී ඇති නිළධාරීන් / නිළධාරිනියන් මෙම පරීක්ෂණ සඳහා සුදුසුකම් ලබයි'

2. **විෂය පථය**

අයදුම්කරුවන් / කාරියන් පහත සඳහන් විෂයන් යටතේ ලිඛිත / වාචික සහ ප්‍රායෝගික වශයෙන් පරීක්ෂණ සඳහා පෙනී සිටිය යුතුයි'

ලිඛිත පරීක්ෂණය පහත සඳහන් විෂයන් යටතේ පැවැත්වේ'

1 ප්‍රථමාධාර විෂය - (සියළුම නිළධාරීන් / නිළධාරිනියන් සඳහා)
2 සිංහල විෂය - (දෙමළ ප්‍රථම භාෂාව වන නිළධාරීන් /නිළධාරිනියන් සඳහා)
3 දෙමළ විෂය - (සිංහල ප්‍රථම භාෂාව වන නිළධාරීන් /නිළධාරිනියන් සඳහා)
4 ඉංග්‍රීසි විෂය - (සියළුම නිළධාරීන් / නිළධාරිනියන් සඳහා)

වාචික පරීක්ෂණය'

1 ප්‍රථමාධාර විෂය - (සියළුම නිළධාරීන් / නිළධාරිනියන් සඳහා)
2 සිංහල විෂය - (දෙමළ ප්‍රථම භාෂාව වන නිළධාරීන් /නිළධාරිනියන් සඳහා)
3 දෙමළ විෂය - (සිංහල ප්‍රථම භාෂාව වන නිළධාරීන් /නිළධාරිනියන් සඳහා)
4 ඉංග්‍රීසි විෂය - (සියළුම නිළධාරීන් / නිළධාරිනියන් සඳහා)

ප්‍රායෝගික පරීක්ෂණය'

1 පිහිණුම් හා ජීවිතාරක්ෂක විෂය - (සියළුම නිළධාරීන් / නිළධාරිනියන් සඳහා)

3. **විභාගය පැවැත්වීම**

විභාග කොට්ඨාසය මගින් නම් කරන ස්ථානයකදී හෝ ස්ථාන කීපයකදී 2009 දෙසැම්බර් මාසය තුලදී මෙම කාර්තු පරීක්ෂණය පැවැත්වීමට කටයුතු කරනු ඇත'

4. **අයදුම්පත්‍ර**

1' මෙම උපදෙස් පත්‍රිකාව සමග ඉදිරිපත් කෙරෙන ආදර්ශ අයදුම්පතට අනුව අයදුම්කරුවන් විසින් A – 4 ප්‍රමාණයේ කොලයක සකස්කරගත් අයදුම්පතක අදාල විස්තර ඇතුලත් කොට ඉදිරිපත් කළ යුතුයි

2' සෑම අයදුම් පත්‍රයක්ම කොට්ඨාස භාර නිළධාරීන් මගින් ආවරණ ලිපියක් සහිතව අයදුම්පත් බාරගන්නා අවසාන දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් බාරදිය හැක.

3. අපහැදිලි" අසම්පූර්ණ හෝ කොට්ඨාස භාර නිළධාරීගේ නිර්දේශය නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

6. **අයදුම්පත් බාර ගැනීම**

2009.11.16 දිනට පෙර පොලිස් විභාග කොට්ඨාසය වෙත අයදුම්පත් ඉදිරිපත් කළ යුතුයි' මෙදිනෙන් පසු ලැබෙන අයදුම්පත් කුමන හේතුවක් නිසාවත් භාරනොගන්නා හෙයින් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව අවධාරණය කරමි' **(ප්‍රමාදවී අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් විභාගය සඳහා පාසැල්වල ඉඩ පහසුකම් වෙන්කරවා ගැනීමේදී සහ අනිකුත් පරිපාලනමය කරුණුවලදී ගැටලු ඇතිවෙන බැවින් නියමිත දිනට පෙර අයදුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න).**

7. **විභාග ප්‍රවේශපත්‍ර**

1. විභාග ප්‍රවේශ පත්‍ර කොට්ඨාස භාර නිළධාරීන් මගින් අයදුම්කරුවන්ට බාරදීමට කටයුතු කරනු ඇත.
2. විභාග ප්‍රවේශ පත්‍ර එක් එක් කොට්ඨාසය වෙත රැගෙනයාම සඳහා කොට්ඨාසය භාර නිළධාරී විසින් වගකිවයුතු නිළධාරියෙකු නම්කර ආවරණ ලිපියක් සහිතව දැනුම් දෙන දිනයකදී විභාග කොට්ඨාසය වෙත එවීමට කටයුතු කරන්න'

**සැලකිය යුතුයි**

1' කොට්ඨාසය තුළ සේවය ස්ථිර කිරීමේ ප්‍රථමාධාර / පිහිණුම් හා භාෂා පරීක්ෂණයට සුදුසුකම් ලබන නිළධාරීන්ගේ ලේඛණයක් තබාගෙන ඒ අනුව අයදුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න'

2' ආධුනික ලිපිගොනු පරීක්ෂාකර සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගේ අයදුම්පත් පමණක් නියමිත දිනට පෙර ඉදිරිපත් කරන්න'

3' සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් වලකින්න'

කේ' අජිත් රෝහණ"
පොලිස් අධිකාරී"
අධ්‍යක්ෂ / විභාග කොට්ඨාශය

(ආදර්ශ අයදුම්පත්‍රය)

සේවය ස්ථිර කිරීමේ ප්‍රථමාධාර / පිහිණුම් හා භාෂා පරීක්ෂණ සඳහා අයදුම්පත.
(ආධුනික උ'පො'ප'/කා'උ'පො'ප' - පො'කො' කා'පො'කො' සහ පො'කො'රි'වරුන් සඳහා)

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) ..........................................................................................
(මුල් අකුරු ඉංග්‍රීසි අකුරින් සඳහන් කරන්න)

2. නිළය හා නිළ අකය :- ..........................................................................................

3. පරීක්ෂණයට පෙනී සිටීමට අදහස් කරන මාධ්‍යය :- ..........................................................

4. සේවය කරන පොලිස් ස්ථානය :- ..........................................................................................

5. කොට්ඨාසය :- ..........................................................................

6. සේවයට බැඳුනු දිනය :- ..........................................................

7. 2009.12.05 දිනට සේවා කාලය අවු:- .............. මාස :-.............. දින :- ................

8. පහත සඳහන් විෂයන් අතුරින් ඔබට පෙනී සිටීමට ඇති විෂය ඉදිරියෙන් ඇති කොටුවේ පෙනී සිටිම් යනුවෙන් සඳහන් කරන්න' ඔබ මෙම විෂයන් ගෙන් එකක් හෝ කීපයක් මේවන විටත් සමත්ව ඇත්නම් සමත්ව ඇත යනුවෙන් අදාල කොටුවේ සඳහන් කරන්න'

| | |
|---|---|
| 1 ප්‍රථමාධාර විෂය | |
| 2 පිහිණුම් විෂය | |
| 3 සිංහල භාෂාව | |
| 4 දෙමළ භාෂාව | |
| 5 ඉංග්‍රීසි භාෂාව | |

මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට මෙහි ඉහත සඳහන් කර ඇති විස්තර සියල්ල නිවැරදි බවට සහතික කරමි' මෙම පරීක්ෂණයට අදාල නීති රීති වලට අනුව මා මෙම පරීක්ෂණයට පෙනී සිටීමට නුසුදුස්සෙකු වුවහොත් පරීක්ෂණය පැවැත්වීමට පෙර හෝ පරීක්ෂණය පැවැත්වෙන අතරතුරදී හෝ පරීක්ෂණය පැවැත්වීමෙන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට යටත් වන බව මා දනිමි'

දිනය :- ..................................... ..........................................................................
(අයදුම්කරුගේ අත්සන)

---------------------------------------------------------------------------------------------------------
---

ස්ථානාධිපතිගේ නිර්දේශය :-

1. ආධුනික උ'පො'ප'/කා'උ'පො'ප'/පො'කො'/කා'පො'කො/පො'කො'රි'...................................................................................... යන නිළධාරියා / නිළධාරිනිය මෙම පරීක්ෂණ සඳහා පෙනී සිටීමට යෝග්‍යතාවය ලබා ඇති බව සහතික කරමි.

2. මෙහි අනු අංක 1 සිට 8 දක්වා සපයා ඇති විස්තර ඔහුගේ / ඇයගේ ආධුනික ලිපි ගොනුවේ සඳහන් පරිදි නිවැරදිය.

අත්සන : ..........................................................................
නම : ..........................................................................
නිළය : ..........................................................................
ස්ථානය : ..........................................................................

දිනය : .......................................

(අ.පි'බ.)

<u>දිස්ත්‍රික්කය භාර නිලධාරියාගේ නිර්දේශය</u> :

ආධුනික උ.පො.ප/ කා.උ.පො.ප./ ආධුනික පො.කො./ කා.පො.කො./ ආධුනික පො'කො'ර් ......................................... ...................................................................... යන නිලධාරියා / නිලධාරිනිය සේවය ස්ථිර කිරීමේ ප්‍රථමාධාර/ පිහිණුම් හා භාෂා පරීක්ෂණයට පෙනී සිටීමට අවශ්‍ය යෝග්‍යතාවය ලබා ඇති බවට සහතික කරමි.

අත්සන : ......................................................................

නම : ......................................................................

නිළය : ......................................................................

දිස්ත්‍රික්කය : ......................................................................

දිනය : .....................................

---

<u>කොට්ඨාසය භාර නිලධාරියාගේ නිර්දේශය</u> :

ආධුනික උ.පො.ප / කා.උ.පො.ප./ ආධුනික පො.කො. / කා.පො.කො./ ආධුනික පො'කො'ර් ........................... .............................................................................. නිලධාරියාගේ අයදුම්පත නිර්දේශකර ඉදිරිපත් කරන අතර ඔහු/ ඇය ......................................... දින පැවැත්වෙන හතර වන කාර්තුවේ සේවය ස්ථිර කිරීමේ ප්‍රථමාධාර / පිහිණුම් හා භාෂා පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍යය සුදුසුකම් සපුරා ඇත.

අත්සන : ......................................................................

නම : ......................................................................

නිළය : ......................................................................

කොට්ඨාසය : ......................................................................

දිනය : .....................................